නවයුගය

2004 දෙසැම්බර්
49 වසර 04 කලාපය



අපතේ යන බලයෙන් විදුලිය නිපදවමු

විදුලිය බලය නූතන ජනජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වී ඇත. ගෙදොරදෙර වැඩකටයුතුවල දී අද විදුලිය බලය නැතිවම බැරි අංගයක් බවට පත් වී ඇත. ඒ නාගරීකරණයේ දියුණුවත්, සංකීර්ණ සමාජ රටාව නිසා ය. එද, අපේ නිවෙස්වල ගෘහනියන් බවුන්ගේ වැඩ සියල්ලක් ම පාහේ කර ගන්නේ බවුන්ගේ දැතිනි. එහෙත් අද ඒ සියල්ලට ම විදුලිය බලය අවශ්‍ය වී ඇත. පොල් මිරිකන්නට, මිරිස් ටික කුඩු කර ගන්නට, රෙදි සෝද ගන්නට, ආහාර පිසින්නට අද විදුලිය බලය අත්‍යවශ්‍ය අංගයකි.

මේ හේතුව අද වන විට විදුලිය බල පරිභෝජනය විශාල ලෙස ඉහළ යෑමට එක් හේතුවකි. අනෙක් අතට ගෙවුණු දස වසරක පමණ කාලය තුළ මෙතෙක් විදුලිය බලය නොලැබුණු ග්‍රාමීය ප්‍රදේශ රාශියකට විදුලිය බලය සැපයීම හේතුවෙන් ද විදුලිය පරිභෝජනය ඉහළ ගියේ ය. ඒ සමගම ග්‍රාමීය මට්ටමේ සුළු කර්මාන්ත, ස්වයං රැකියා වැනි දේ ආරම්භ වීම නිසාත් විදුලිය පරිභෝජනය ඉහළ ගියේ ය.

අනෙක් අතට රට තුළ කාර්මික අංශයේ සිදු වන වර්ධනය ද විදුලිය අවශ්‍යතාව ඉහළ දැවීමට ප්‍රබල සාධකයක් වී ඇත.

මේ තත්ත්වය හමුවේ විදුලිය බලය වැඩි වැඩියෙන් උත්පාදනය කිරීමේ අවශ්‍යතාව මතු වී තිබේ. මෙතෙක් අප රටේ විදුලිය බලය උත්පාදනය රැඳී පැවැතුණේ ප්‍රධාන ක්‍රම දෙකක් මත ය. එකක් ජල විදුලි බලාගාරවලින් විදුලිය උත්පාදනය කිරීම ය. අනෙක ඩීසල් විදුලි බලාගාර මගින් විදුලිය උත්පාදනය කිරීම ය. මේ ක්‍රම දෙක මත පමණක් යැපීමට නොහැකි තත්ත්වයක් මේ වන විට මතු වී තිබේ. ජල විදුලි බලාගාරවලින් උත්පාදනය කළ හැකි විදුලිය බල ප්‍රමාණය සීමිත වීම එක් හේතුවකි. නියං සමයට ඒ ප්‍රමාණය අවම වීම තවත් හේතුවකි.

ඩීසල් විදුලි බලාගාරවලින් උත්පාදනය කෙරෙන විදුලිය බලය සඳහා වන ඉහළ පිරිවැය අප රටේ ආර්ථිකයට දරන්නට නොහැකි තරම් ඉහළ මට්ටමක පැවැතීම තවත් හේතුවකි. ඒ සඳහා වන මූලික වියදම මෙන්ම ඩීසල් සඳහා ද විශාල වියදමක් දැරීමට සිදු වේ.

මේ තත්ත්වය හමුවේ ඉහළ යන විදුලිය පරිභෝජනයට අනුව විදුලිය උත්පාදනය කිරීම සඳහා විකල්ප කිහිපයක් යෝජනා වී ඇත. ගල් අඟුරු තාප විදුලි බලාගාරයක් ස්ථාපනය කිරීම එකකි. එහෙත් ඉන් සිදු වේ යැයි කියන පාරිසරික හානිය, විදුලි බලාගාරය ස්ථාපිත කිරීමට යන විශාල වියදම නිසා ගල් අඟුරු විදුලි බලාගාර මගින් විදුලිය උත්පාදනය කිරීම ද විචාදයට තුඩු දෙන්නක් වී තිබේ. කෙසේ වෙතත් ඉහළ යන විදුලිය බල පරිභෝජනය හමුවේ තාප විදුලි බලාගාරයක දැඩි අවශ්‍යතාව මතු වී ඇති බව අදාල අංශවල නිගමනය වී ඇත.



විදුලිය බල ඉල්ලුම සම්පූර්ණ කිරීමට නොහැකි වෙතත් යම් ප්‍රමාණයකින් හෝ ඊට දායක වන්නට හැකි තවත් විකල්ප විදුලි බල උත්පාදන ක්‍රම කිහිපයක් කෙරෙහි විශේෂඥයන්ගේත් ආයෝජකයන්ගේත් අවධානය මේ වන විටත් යොමු වී තිබේ.

සුළං මගින් විදුලිය උත්පාදනය, කුඩා පරිමාණ ජල විදුලි බලාගාර මගින් විදුලිය උත්පාදනය, සූර්ය කෝෂ මගින් විදුලිය නිපදවීම ඒ විකල්ප ක්‍රම වේ. මේ ක්‍රම නූන මගින් ම විදුලිය උත්පාදනය කිරීමේ දී ඒ සඳහා වන අවම වියදමත්, පාරිසරික වශයෙන් සිදු වන අවම හානියත්, ඒ ක්‍රම සඳහා අප රටේ ඇති ස්වාභාවික සම්පත් පිළිබඳවත් සැලකීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ දැඩි අවධානය ඒ සඳහා යොමු විය යුතු කාලය එළඹ ඇත.



මේ වන විටත් ඒ පිළිබඳ සැලකිය යුතු අවධානයක් යොමු වී ඇතත් ඒවා ක්‍රියාත්මක කිරීමේ දී විවිධ බාධක මතු වී ඇති බව පෙනෙන්නට තිබේ. මහා පරිමාණ ඩීසල් තාප විදුලි බලාගාරවලින් විදුලිය උත්පාදනය කිරීමේ දී ඇතැමුන්ගේ සාක්කුවලට ලැබෙන අමතර විශාල ආදායම නිසා ඉහත කී විකල්ප විදුලිය උත්පාදන ක්‍රම දිරි ගැන්වීම වෙනුවට ඒවාට බාධා කිරීමට පවා ඒ වාසි ලබන පියවර ගැනීම ය.

මේ විකල්ප විදුලි උත්පාදන ක්‍රම සඳහා මහා පරිමාණ ආයෝජන අවශ්‍ය නොවන නිසා දේශීය ආයෝජකයෝ ඒවා සඳහා ආයෝජනය කිරීමට ඉදිරි පත් වී සිටිති. එහෙත් ඇතැම් තැන්වල නිලධාරීන්ගෙන් එල්ල වන බාධක බවුන් අධෛර්යමත් කිරීමට හේතු වී තිබේ. දේශපාලන අධිකාරියේ සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ දැඩි අවධානය මේ කෙරෙහි යොමු විය යුතුය.

සුළං, සූර්ය කෝෂ හා සුළු පරිමාණ ජල විදුලි බලාගාරවලින් තමන්ට අවශ්‍ය කරන විදුලිය ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පිරිමසා ගන්නා රටවල් කිහිපයක් පිළිබඳ විස්තර මේ නවයුගය කලාපයේ අඩංගු වී ඇත. අප කළ යුත්තේ ඒ රටවල අනුගමනය කරන ක්‍රම පිළිබඳ අධ්‍යයනය කොට අපේ රටේත් හැකි උපරිම මට්ටමෙන් ඒවා ක්‍රියාත්මක කිරීම ය. ඒ මගින් පිටරට ඇදී යන විශාල ධනයක් ඉතිරි කර ගැනීමට හැකි ය. දේශීය අයෝජකයන්ට අවස්ථාව ලබා දෙන්නට හැකි ය. රැකියා අවස්ථා ද උදා කිරීමට හැකි ය. ඒ සියල්ල සමඟ විදුලිය සඳහා පාරිභෝගිකයන්ට දරන්නට වන මිල අවම කළ හැකි ය.